සියලු ම හිමිකම් ඇවිරිණි.

SRI LANKA

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර II විභාගය - 2025 ජූලි

## (203) ව්‍යාපාර නීතිය

(Business Law)

2025-07-26
පස්වරු
[01.45 – 05.00]

පිටු ගණන : 07
ප්‍රශ්න ගණන: 07

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):
  - (1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
    *උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*
  - (2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***
  - (3) *ඉල්ලුම් කරන ලද **මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,** ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.*
  - (4) *උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*
  - (5) *අර්ථකථන සහිත **කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව** අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*
  - (6) *ලකුණු 100 යි.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

(මුළු ලකුණු 25)

### 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.6 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම නිවැරදි උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාල අංකය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.1** පහත සඳහන් අධිකරණ අතුරෙන්, අවසාන අභියාචනා බලය සම්බන්ධයෙන් අධිකරණ බලය පවතින්නේ කුමන අධිකරණයටද?

(1) දිස්ත්‍රික් අධිකරණය. (2) ශ්‍රේෂ්ඨාධිකරණය.
(3) මහේස්ත්‍රාත් අධිකරණය. (4) මහාධිකරණය.

**1.2** පහත සඳහන් නීති අතුරෙන්, ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශයේ, යාපනය අර්ධද්වීපයේ ජීවත් වන දෙමළ වැසියන්ට පමණක් අදාල වන නීතිය කුමක් ද?

(1) මුස්ලිම් නීතිය. (2) ඉංග්‍රීසි නීතිය.
(3) උඩරට නීතිය. (4) තේසවලාමේ නීතිය.

**1.3** පහත සඳහන් ඒවා අතුරෙන්, ගනුදෙනු කළ හැකි ලියවිල්ලක ලක්ෂණයක් **නොවන්නේ** කුමක් ද?

(1) බාරදීමෙන් පසු ලියවිල්ලේ අයිතිය පැවරිය හැකි වීම.
(2) ගනුදෙනු කළ හැකි ලියවිලි පැවරිය නොහැකි වීම.
(3) ලියවිල්ල දරන්නාට, ඔහුගේ හෝ ඇයගේ නමින් නඩු පැවරිය හැකි වීම.
(4) පැවරුම්ලාභියාට ලියවිල්ල සම්බන්ධයෙන් හොඳ හිමිකමක් ලැබීම.

1.4 පහත සඳහන් ඒවා අතුරෙන්, ජාත්‍යන්තර වෙළඳාමේදී භාවිත වන ගෙවීම් ක්‍රමයක් **නොවන්නේ** කුමක් ද?

(1) විනිමය බිල්පත්.
(2) චෙක්පත්.
(3) විවෘත ගිණුම් හරහා ගෙවීම.
(4) අත්තිකාරම් ගෙවීම.

1.5 පහත සඳහන් ඒවා අතුරෙන්, විකුණුම්කරුට හිමි ප්‍රතිකර්මයක් වන්නේ (remedy) කුමක් ද?

(1) භාණ්ඩ බාර නොදීම සම්බන්ධයෙන් නඩු පැවරීම.

(2) නැවත විකිණීමේ බලය.

(3) ප්‍රතිඥාභාර කඩ කර ඇති විට වන්දි ලබා ගැනීමේ අයිතිය.

(4) නියත ඉටුකිරීමේ ආඥාවක් ලබා ගැනීම.

1.6 පහත සඳහන් ඒවා අතුරෙන්, භාණ්ඩ විකිණීමේ නීතිය සම්බන්ධයෙන් නිවැරදි **නොවන්නේ** කුමක් ද?

(1) භාණ්ඩ විකිණීමේ ගිවිසුමක මුදල් ප්‍රතිඥාවක් තිබිය යුතුය.

(2) විකුණුම්කරු විසින් භාණ්ඩවල අයිතිය, ගැනුම්කරුට පැවරීමට හෝ එසේ කිරීමට එකඟ විය යුතුය.

(3) විකුණුම් ගිවිසුමක්, සිදුකළ හැක්කේ ලිඛිතව පමණි.

(4) භාණ්ඩ විකිණීමේ නීතියට අදාලව ව්‍යංග කොන්දේසි මෙන්ම ප්‍රතිඥාභාර ද තිබේ.

(එකකට ලකුණු 02 බැගින්, ලකුණු 12)

*අංක 1.7 සිට 1.9 දක්වා ප්‍රශ්නවල දී ඇති එක් එක් ප්‍රකාශය **සත්‍ය** හෝ **අසත්‍යදැයි** දක්වන්න. **සත්‍ය** හෝ **අසත්‍ය** යන උත්තරය ප්‍රශ්න අංකය සමඟ, ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.7 භාණ්ඩ විකිණීමේ ගිවිසුමකට අනුව, ගිවිසුමේ විෂය වස්තුව භාණ්ඩ විය යුතුය.

1.8 නිශ්චිත භාණ්ඩ යනු භාණ්ඩ සඳහා පාර්ශවකරුවන් එකඟ වූ නමුත් අදාල භාණ්ඩ වශයෙන් නිවැරදිව හඳුනා නොගත් භාණ්ඩ වේ.

1.9 විනිමය බිල්පතක අණලද්දා සැමවිටම බැංකුවක් වේ. (එකකට ලකුණු 01 බැගින්, ලකුණු 03)

*අංක 1.10 සිට 1.14 දක්වා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර, ප්‍රශ්න අංක ද සමඟ, ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.10 "CIF (මිල, රක්ෂණය සහ ගැල් කුලිය) ගිවිසුමකදී", විකුණුම්කරු විසින් ගැනුම්කරුට ලබාදිය යුතු ලියවිලි දෙකක්(02) සඳහන් කරන්න.

1.11 2006 අංක 05 දරණ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනතේ ප්‍රධාන අරමුණ සඳහන් කරන්න.

1.12 විනිමය බිල්පතක් පිටසන් කිරීමක් (endorsement) යනුවෙන් අදහස් වන්නේ කුමක්දැයි යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

1.13 ආයෝජන මණ්ඩලයේ (Board of Investment) කාර්යයන් දෙකක්(02) සඳහන් කරන්න.

1.14 ගනුදෙනු කළ හැකි ලියවිලි සඳහා උදාහරණ දෙකක්(02) සඳහන් කරන්න.

(එකකට ලකුණු 02 බැගින්, ලකුණු 10)
(මුළු ලකුණු 25)

*A කොටසෙහි අවසානය*

## B කොටස

(මුළු ලකුණු 50)

### 02 වන ප්‍රශ්නය

**මිතුකි** ඉලෙක්ට්‍රොනික උපකරණ අලෙවිකරණ කුඩා ව්‍යාපාරයක හිමිකාරිණියක් වේ. ඇය විසින් දිවයින පුරා විකුණුම් හැසිරවීම සඳහා මෑතකදී **ශාමා** ඇගේ නියෝජිතයා ලෙස පත්කර ගන්නා ලදී. නැවත විකිණීමේ අරමුණෙන් ඉලෙක්ට්‍රොනික උපකරණ මිලදී ගැනීමේ ගිවිසුම් පිළිබඳ සාකච්ඡා කිරීමට සහ **මිතුකි** වෙනුවෙන් ගිවිසුම්වලට අත්සන් කිරීමට **ශාමා** ට බලය ලබාදී ඇත. එක් දිනක්, **ශාමා** විශාල ඉලෙක්ට්‍රොනික උපකරණ ප්‍රමාණයක් ලබා ගැනීම සඳහා සැපයුම්කරුවෙකු සමඟ ගිවිසුමකට එළඹුණු නමුත්, ඇය ගනුදෙනුව පිළිබඳව තොරතුරු **මිතුකි** ට නොදැන්වූවාය. ඇණවුම ලැබුණු පසු, මෙම උපකරණ සඳහා සාමාන්‍යයෙන් ගෙවන මිලට වඩා මිල වැඩි බව **මිතුකි** ට අවබෝධ විය. එමනිසා, මෙම ගනුදෙනුවෙන් **මිතුකි** ට අලාභයක් දැරීමට සිදුවිය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ඉහත සිද්ධියට අදාලව, නියෝජ්‍යත්ව නීතිය යටතේ **ශාමා** විසින් අත්සන් කරන ලද ගිවිසුමට **මිතුකි** බැඳී සිටින්නේ ද යන්න **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(b) **මිතුකි** ට අලාභයේ පිරිවැය **ශාමාගෙන්** අයකරගත හැකිද යන්න **පැහැදිලි කරන්න.** (ලකුණු 06)

(මුළු ලකුණු 10)

### 03 වන ප්‍රශ්නය

**ඇන්,** 2016 අප්‍රේල් 01 දින රු.100,000/- ක වැටුපකට සීමාසහිත පෞද්ගලික සමාගමක සේවයට බැඳුනාය. ඇයට 2025 ජූලි 01 දින සිට BPO සමාගමක් සමඟ සේවය කිරීමේ අවස්ථාවක් උදා විය. එබැවින්, ඇය 2025 ජූනි 30 දින සිට බලපැවැත්වෙන පරිදි සේවයෙන් ඉවත්වීමේ ලිපිය ලබා දී ඇත. ඇයගේ අවසන් මාසයේ වැටුප රු.300,000/- ක් විය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) සේවය අවසන් කරන අවස්ථාවේ **ඇන්ගේ** පාරිතෝශික හිමිකම (gratuity entitlement) **ගණනය කරන්න.** (ලකුණු 04)

(b) 1954 අංක 19 දරණ සාප්පු හා කාර්යාල සේවක පනත යටතේ, සේවකයින්ට හිමි නිවාඩු වර්ග තුනක්(03) **සඳහන් කරන්න.** (ලකුණු 03)

(c) සේවා ස්ථානයකදී සේවකයින්ට හිමිවන මානව අයිතිවාසිකම් තුනක්(03) **හඳුනා දක්වන්න.** (ලකුණු 03)

(මුළු ලකුණු 10)

### 04 වන ප්‍රශ්නය

**සමන්තා** සතුව කොළඹ කුඩා සිල්ලර වෙළෙඳසැලක් තිබේ. සොරකම් හා දේපළ හානිවලින් තම ගබඩාව ආරක්ෂා කර ගැනීම සඳහා **සීමාසහිත Secure Insurance සමාගමෙන්** රක්ෂණ ඔප්පුවක් ඇය, ලබාගන්නා ලදී. රක්ෂණ අයදුම්පත සම්පූර්ණ කරන අතරතුර, ඇගේ ගබඩාවේ සක්‍රිය CCTV කැමරා පද්ධතියක් තිබේදැයි ඇයගෙන් විමසන ලදී. වසර කිහිපයකට පෙර සවිකර තිබූ සියළුම කැමරා තවමත් හොඳ තත්වයෙන් ක්‍රියාත්මක වන බව විශ්වාස කරමින් ඇය විසින් වැරදීමකින් "ඔව්" ලෙස සඳහන්කොට ඇත. කෙසේවුවද, පසුගිය මාස තුනක කාලයක සිට CCTV පද්ධතිය නිසිලෙස ක්‍රියාත්මක නොවන අතර, ඇය විසින් එය පරීක්ෂා කර හෝ අළුත්වැඩියා කර නොමැත.

මාස කිහිපයකට පසුව, **සමන්තාගේ** ගබඩාවේ සොරකමක් සිදුවූ අතර, සිදුවූ පාඩුව වෙනුවෙන් ඇය **සීමාසහිත Secure Insurance සමාගම** වෙත වන්දි හිමිකමක් ඉදිරිපත් කරන ලදී. සොරකම සිදුවන අවස්ථාවේ CCTV පද්ධතිය ක්‍රියාත්මක නොවූ බව රක්ෂණ සමාගම විසින් විමර්ශනය අතරතුරදී, සොයාගන්නා ලදී. තවද, රක්ෂණ ඔප්පුව ලබාගන්නා අවස්ථාවේදී ද එය ක්‍රියාත්මක නොවූ බවට අනාවරණය විය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **සමන්තාට,** සොරකමින් සිදුවූ පාඩුව සඳහා **සීමාසහිත Secure Insurance සමාගමෙන්** රක්ෂණ වන්දිය ලබාගත හැකිද යන්න **විමසන්න.** (ලකුණු 04)

(b) රක්ෂණයේ "ආදේශන මූලධර්මය" (Principle of Subrogation) **පැහැදිලි කරන්න.** (ලකුණු 03)

(c) රක්ෂණ ගිවිසුමක මූලිකාංග තුනක්(03) **සඳහන් කරන්න.** (ලකුණු 03)

(මුළු ලකුණු 10)

## 05 වන ප්‍රශ්නය

**අමරා** යනු දේපළ කළමනාකරණය පිළිබඳ විශේෂඥ සමාගමක් වන **සීමාසහිත XYZ (පෞද්ගලික) සමාගම** ආරම්භ කරන ලද තරුණ ව්‍යවසායිකාවකි. ඇය, සමාගමේ එකම කොටස් හිමිකාරිය සහ අධ්‍යක්ෂවරිය වුවද සියළුම නීතිමය විධිවිධාන ඇය අනුගමනය කරනු ලබයි. **සීමාසහිත XYZ (පෞද්ගලික) සමාගම,** ව්‍යාපාරය පුළුල් කිරීම සඳහා National **බැංකුවෙන්** රු.500,000/- ක ණයක් ලබාගන්නා ලදී. අවාසනාවන්ත ලෙස ආර්ථික පසු බෑස්ම හේතුකොටගෙන, සමාගම මූල්‍ය දුෂ්කරතාවයන්ට මුහුණ දුන් අතර, බැංකු ණය වාරික ගෙවීම පැහැර හරින ලදී.

ඇය සමාගමේ සම්පූර්ණ හිමිකාරීත්වය දරණ බැවින්, ණය ආපසු ගෙවීමේ වගකීම ඇය විසින් දැරිය යුතු බවට තර්ක කරමින් බැංකුව විසින් **අමරා** ට එරෙහිව පෞද්ගලිකව නඩු පවරන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) "වෙන්වූ නෛතික පුද්ගලභාවය" (separate legal personality) යන මූලධර්මයට අනුව, **සීමාසහිත XYZ (පෞද්ගලික) සමාගමේ** ණය සඳහා **අමරා**, පුද්ගලිකවම වගකීමට බැඳේද යන්න **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(b) සමාගමක් විසින් පවත්වා ගෙන යායුතු ව්‍යවස්ථාපිත පොත් (statutory books) සහ රෙජිස්ටර් (registers) තුනක්(03) **ලැයිස්තුගත කරන්න.** (ලකුණු 03)

(c) *"සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය මත පදනම්ව, සමාගමක් ඕනෑම ව්‍යාපාරයක් හෝ ඕනෑම කටයුත්තක්, ක්‍රියාවක් සිදුකිරීම හෝ ඕනෑම ගනුදෙනුවකට එළඹීම සිදුකළ යුතුය."*

ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟවේද යන්න **පැහැදිලි කරන්න.** (ලකුණු 03)

(මුළු ලකුණු 10)

## 06 වන ප්‍රශ්නය

හපුතලේ ප්‍රදේශයේ පිහිටි කුඩා ගම්මානයක් අති විශිෂ්ඨ තේ වර්ගයක් නිෂ්පාදනය සඳහා ප්‍රසිද්ධ වන අතර, කලාපයේ පවතින නිශ්චිත දේශගුණය සහ පාංශු තත්ත්වයන් හේතුවෙන් **"හපුතලේ-තේ"** එහි සුවිශේෂී රසය සඳහා ප්‍රසිද්ධ වේ. ගාල්ල දිස්ත්‍රික්කයේ සිටින තේ නිෂ්පාදකයෙකු, හපුතලෙන් පැමිණෙන තේ බව පවසමින් ඊට සමාන තේ වර්ගයක් එම නමින්ම අලෙවි කිරීම ආරම්භ කරන ලදී. හපුතලේ ගම්මානයේ තේ නිෂ්පාදකයින් මෙම වැරදි අර්ථ නිරූපණය මගින් ඔවුන්ගේ කීර්තිනාමයට සහ විකුණුම්වලට හානිදායක වනු ඇතැයි කණස්සල්ලට පත්ව සිටී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) බුද්ධිමය දේපළ පනත යටතේ ආරක්ෂා කර ඇති පහත සඳහන් බුද්ධිමය දේපළ **පැහැදිලි කරන්න**:

(i) වෙළෙඳ ලකුණ.

(ii) පේටන්ට්. (ලකුණු 04)

(b) හපුතලේ ගම්මානයේ තේ නිෂ්පාදකයින්ට ඔවුන්ගේ තේවල සුවිශේෂී අනන්‍යතාවය, ගාල්ල දිස්ත්‍රික්කයේ නිෂ්පාදකයා විසින්, අනිසි ලෙස එය භාවිත කිරීමෙන් ආරක්ෂා කරගැනීමට හපුතලේ නිෂ්පාදකයින්ට බුද්ධිමය දේපළ නීතිය භාවිත කළ හැකි ආකාරය **පැහැදිලි කරන්න.** (ලකුණු 06)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

(මුළු ලකුණු 25)

### 07 වන ප්‍රශ්නය

(A) **දිනුක** සහ ඔහුගේ මිතුරියක් වන **හසිනි**, මහත් අපේක්ෂාවෙන් කොළඹ ගෘහස්ත ක්‍රීඩාංගනයක පැවති සංගීත සංදර්ශනයකට සහභාගී විය. මෙම අවස්ථාවට ජනප්‍රිය ශ්‍රී ලාංකික සහ ජාත්‍යන්තර කලාකරුවන් සහභාගී වූ අතර, බොහෝ පිරිසක් ආකර්ශනය කරගැනීමට එය සමත් විය.

**දිනුක,** රථ ගාල් සහායකගේ මග පෙන්වීම මත තම මෝටර් රථය ක්‍රීඩාංගනයේ පිහිටි රථගාලේ නතර කරනු ලැබීය. රථ ගාලේ ඇති වාහනවලට සිදුවන හානි සහ සොරකම් සම්බන්ධයෙන් සංවිධායකයින් වගකීමට නොබැඳෙන බව රථගාල් සහායක විසින් **හසිනි** ට සහ **දිනුක** ට දැනුම්දෙන ලදී. ප්‍රසංග ස්ථානයට ඇතුල්වීමට පෙර, ඔවුන් විසින් ප්‍රවේශ පත්‍ර කුටියෙන් ප්‍රවේශපත් මිලට ගන්නා ලදී.

ඔවුන් තම ටිකට්පත් ලබාගත් අවස්ථාවේදී, මුදල් අයකැමි විසින් ටිකට් පතේ සඳහන් සටහනක් ඔවුන්ට පෙන්නුම් කරන ලදී:

*"මෙම ටිකට් පත මිලදී ගැනීමෙන්, ස්ථානය තුළ නැති වූ හෝ සොරකම් කරන ලද භාණ්ඩ සඳහා උත්සව සංවිධායකයින් වගකියනු නොලබන බව ඔබ එකඟ වේ."*

ඇතුල්වීමේ දොරටුවේ, පහත පරිදි තවත් පුවරුවක් කැපී පෙනෙන ලෙස ප්‍රදර්ශනයකොට තිබුණි:

*"ක්‍රීඩාංගණය ඇතුළතදී ඇති පුද්ගලික බඩු බාහිරාදිය නැතිවීම, සොරකම් කිරීම, හානි වීම සම්බන්ධයෙන් උත්සව සංවිධායකයින් වගකීම දරණු නොලැබේ."*

**හසිනි** විසින් ක්‍රීඩාංගණය තුළ ඇති **ABC Music Centre** නමින් ප්‍රදර්ශනය කර තිබූ ප්‍රවර්ධන කුටියක් නිරීක්ෂණය කළ අතර, එහි සඳහන් වූයේ ප්‍රසිද්ධ ශ්‍රී ලාංකික කලාකරුවෙකුගේ සීමිත සංස්කරණ සංයුක්ත තැටි [Compact Disks (CDs)] එම කුටියේ ඇති අතර, එකක් රු.12,500/- ක් මිල වන බවත්ය. ඉතා උද්යෝගිමත් සංගීත නිර්මාණ එකතු කරන්නෙකු ලෙස, සංස්කරණ සංයුක්ත තැටියක් එය මිලට ගැනීමට මහත් කැමැත්තකින් පසු වූවාය. නමුත්, ඇය සංස්කරණ සංයුක්ත තැටියක් මිලදී ගැනීම සඳහා ප්‍රවර්ධන කුටියේ කාර්ය මණ්ඩලය වෙත පැමිණි විට, එම තැටි විකිණීමට නොව ප්‍රදර්ශන කටයුතු සඳහා පමණක් තබා ඇති බව ඔවුන් ඇයට දැනුම්දෙන ලදී.

ප්‍රසංගය අවසානයේදී, **දිනුක** සහ **හසිනි** වාහන නැවැත්වීමේ ස්ථානය වෙත පැමිණි අතර, එහිදී ඔවුන්ට දක්නට ලැබුනේ **දිනුකගේ** මෝටර් රථයේ ජනේලය කැඩී ගොස් ඇති බවත්, ඔහුගේ ලැප්ටොප් (laptop) පරිගණකය ද අතුරුදහන් වී ඇති බවත්ය. මීට අමතරව ප්‍රසංගයට පෙර **හසිනි** විසින් තම අත් බෑගය තුළ තබා තිබූ ජංගම දුරකතනයද අස්ථානගතවී ඇති බව, ඇයට පසුව අවබෝධ විය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) සීමිත සංස්කරණ සංයුක්ත තැටි (Compact Disks) සඳහා **හසිනි** සහ **ABC Music Centre** අතර වලංගු ගිවිසුමක් පවතින්නේද යන්න **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(b) **දිනුක** සහ **හසිනිගේ** නැතිවූ බඩු බාහිරාදිය පිළිබඳව උත්සව සංවිධායකයින්ට එරෙහිව ඔවුන්ගේ නීතිමය අයිතිවාසිකම් **විමසන්න.** (ලකුණු 07)

(c) ප්‍රේක්ෂකයන්ගේ නැතිවූ භාණ්ඩ සම්බන්ධයෙන් උත්සව සංවිධායකයින්ගේ නීතිමය බැඳීම් **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(B) නිදහස් ග්‍රැෆික් නිර්මාණ ශිල්පිණියක් වන **මාලා**, ඇගේ කටයුතු සඳහා ඉහළ කාර්යක්ෂමතාවයකින් යුත් ලැප්ටොප් පරිගණකයක් (laptop) මිලදී ගැනීමට තීරණය කරන ලදී. ඇය ප්‍රසිද්ධ ඉලෙක්ට්‍රොනික් වෙළෙඳසැලකට ගොස් ග්‍රැෆික් නිර්මාණකරණය සහ වීඩියෝ සංස්කරණය සඳහා සුදුසු ඉහළ සැකසුම් බලයක් සහ උසස් තත්ත්වයේ දර්ශන තිරයක් (excellent display quality) සහිත ලැප්ටොප් පරිගණකයක් අවශ්‍ය බව අලෙවි නියෝජිතයාට දැනුම්දෙන ලදී. එක්තරා විශේෂිත මාදිලියක් මඟින් ඇයගේ සියළු වෘත්තීය අවශ්‍යතා සපුරාලන බවට අලෙවි නියෝජිතයා ඇයට සහතික විය.

එම උපදෙස අනුගමනය කරමින්, **මාලා** විසින් විස්තරාත්මක පරීක්ෂාවකින් තොරව ලැප්ටොප් පරිගණකයක් මිලදී ගනු ලැබීය. කෙසේවුවද, ලැප්ටොප් පරිගණකය තම නිවසේදී ස්ථාපනය (setting up) කිරීමෙන් පසු පහත පරිදි විවිධ ගැටළු රැසකට මුහුණ පෑමට ඇයට සිදුවිය:

(1) එහි තිර විභේදනය (display resolution) පහළ මට්ටමක වූ අතර, එමඟින් උසස් තත්ත්වයේ නිර්මාණ සිදුකිරීම අපහසු විය.

(2) ලැප්ටොප් පරිගණකය නිතර රත්වීම නිසා එය වීඩියෝ සංස්කරණ කටයුතු සඳහා සුදුසු නොවීම.

(3) සති දෙකක භාවිතයෙන් පසුව, බැටරිය නිසි ලෙස ආරෝපණය නොවන අතර, එමඟින් ඇගේ කාර්යයන්ට තවදුරටත් බාධා පැමිණුනි.

කලකිරීමට පත් වූ **මාලා,** වෙළෙඳසැලට කතා කළ නමුත්, ඔවුන් භාණ්ඩය දැනටමත් විකුණා ඇති බව පවසමින්, ආපසු බාර ගැනීම හෝ මුදල් ආපසු ලබාදීම ප්‍රතික්ෂේප කරන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ඉහත සිදුවීමේ කරුණුවලට අදාළව, පහත ක්ෂේත්‍ර ආවරණය කරමින් **මාලාට** ඇති නීතිමය අයිතිවාසිකම් **පැහැදිලි කරන්න**:

(a) භාණ්ඩ විකිණීමේ ආඥා පනත යටතේ ඇති ව්‍යංග කොන්දේසි උල්ලංඝණය කිරීම.

(b) **මාලා** ට ඇති නීතිමය ප්‍රතිකර්ම. (ලකුණු 10)

(මුළු ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | **සඳහන් කරන්න** | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | **හඳුනා දක්වන්න** | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | **හඳුනාගන්න** | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | **අර්ථකතනය කරන්න** | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | **විස්තර කරන්න** | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | **පැහැදිලි කරන්න** | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැලපීම. | **සසඳන්න** | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | **පිළියෙල කරන්න** | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | **ප්‍රදර්ශනය කරන්න** | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | **සන්නිවේදනය කරන්න** | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **සමානකම් බලන්න** | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **විමසන්න** | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දෑ හඳුනා ගැනීම. |
| | | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |